# සදහම සවිමත් පරම්පරාවක්
# මිනිසි දහම් සරු සිරි ලංකාවක්

1918
2018
# සියවස සමරුව

## සිරි වජිරාරාම දහම්පාසල
## සිරි වජිරාරාමය
## බම්බලපිටිය

**පරිගණක පිටු සැකසුම, කවර නිර්මාණය සහ මුද්‍රණය :**
රුවන් පහරුව
අංක 14/10, පළමු පටුමග,
අපේක්ෂා රෝහල පාර,
මහරගම.
දුර/ෆැක්ස් : 011-2840738, 0714-320810
E-mail: ruwanpaha@gmail.com

# සිරි වජිරාරාම දහම් පාසලේ සියවස් සමරුව

සිරිලක පැරණි දහම් පාසලක් වන බම්බලපිටියේ සිරි වජිරාරාම දහම් පාසලට 2018 අගෝස්තු 18 වනදට හරියට ම සියවසක් සපිරෙයි. ඒ නිමිත්තෙන් වසරක් පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් මාලාවක් දහම් පාසලේ කළමනාකරණ මණ්ඩලය සැලැසුම් කර ඇත. පසුගිය අගෝස්තු 18 දින සවස විශේෂ ආශීර්වාදත්මක බෝධි පූජා පින්කමකින් සියවස් ජයන්තියේ ආරම්භය සනිටුහන් කැරිණ.

ශ්‍රී ලංකාවේ සමස්ත දහම් පාසල් පද්ධතියේ නව පිවිසුම් දෙරකට කිසියම් සවිමත් පදනමක් දැමීම සියවස් සමරුවේ එක් අභිප්‍රායයෙකි. දහම් පාසල් අධ්‍යාපනයට එළි වැටක් දල්වමින් අඩු පහසුකම් ඇති ව උනන්දුවෙන් පවත්වාගෙන යනු ලබන දහම් පාසලකට ප්‍රතිපත්ති පෝෂණය සහිත ව පහසුකම් සලසා දීම එහි ලා වැදගත් වන තවත් අරමුණකි.

පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ පුරෝගාමී අනුශාසකත්වයෙන් 1918 අගෝස්තු මස 18 වන ද ඇරඹුණු "වජිරාරාම දහම් පාසල" නමැති ධර්ම කේන්ද්‍රය, අගනුවර හැදෙන වැඩෙන සිංහල බෞද්ධ දරු - දැරියනට අමිල ධර්ම කේන්ද්‍රයක් වූයේ ධර්ම භාණ්ඩාගාර වැනි උතුම් සංඝපිතෘන් වහන්සේ ලා ගේ ආදර්ශවත් අනුශාසනය හා ආකර්ශනීය උපදේශනය එහි නොමඳ ව ලැබුණු නිසා ය.



අගනුවර සාමාන්‍ය පවුල්වල මවුපියවරුන් පමණක් නො ව, ප්‍රභූ පවුල්වල දෙමවුපියන් ද තම දරුවනට ආගමික පරිසරයක් යටතේ අනාගත ලෝකය නිර්මාණය කැර දීමේ වැදගත්කම දුටුවේ එ වක ඉඩ කඩ, ගොඩනැගිලි පහසුකම් පවා නො තිබුණු මේ පුංචි ආරාමයේ විකසිත දහම් සුවඳ ඔවුන් මැනැවින් ආඝ්‍රාණය කළ නිසා ය. ඩී. එස්. සේනානායක, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිවරුන් සිය දරුවන් මෙම දහම් හෙවණෙහි කුඩා වියේ පටන් හික්මවූයේ ද, ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, බර්නාඩ් සොයිසා, ලලිත් ඇතුලත්මුදලි යන කීර්තිමත් රාජ්‍ය නායකයනට බුදු දහමේ ශික්ෂණ හිමිකැර දෙනු ලැබූයේ ද, සමාජයට නායකත්වය හා මඟ පෙන්වීම් ලබාදුන් තවත් බොහෝ වියතුනට, සමතුනට, පෙදෙස් වැසියනට දහම් කෙම් බිමක් වූයේ ද භෞතිකය අබිබවා අධ්‍යාත්මයට නැඹුරු වූ දහම් දිවි මඟක් මේ පින්බිම තුළ එළි පෙහෙළි වූ නිසා ය.

පැළෑණේ මහ නාහිමියන් ගේ ඇවෑමෙන් විදුරු අරම පින්බිමේ අදිපතියාව හෙබැවූ අතිපූජ්‍ය නාරද මාහිමියෝ සිරි වජිරාරාම දහම් පාසලේ ඉදිරි දියුණුවට අත්‍යන්ත ආලෝකයක් ද රැකවරණයක් ද ලබා දුන්හ. දරුවනට දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කැරුණේ උන්වහන්සේ ගේ පරිශ්‍රමය නිසා ය. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි, අතිගරු කඹුරුගමුවේ මහානාම මාහිමි, අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුල මාහිමි, අතිගරු ගංගොඩවිල සෝම හිමි වැනි මහ යතිවරුන් නිසා ද සිරිමෙවන් පියසිංහ මහතා වැනි පාලනයෙහි හා

අධ්‍යාපනයෙහි දක්ෂ ගුරු භවතුන් නිසා ද දහම් පාසල එදා මෙදාතුර ගුණාත්මක ව හා සංවර්ධනාත්මක ව ලද සුපෝෂණය වචනයෙන් කිව නොහැකි තරම් ය.

ඒ උතුමන් හෙළි කළ දහම් මඟ ඔස්සේ වඩාත් ප්‍රායෝගික ව, ළමා මනස හා දිවිය දහමින් තෙදවත් කිරීමේ සැලැසුම් ඇති ව, දහම් ගුරුකමේ වටිනාකම වටහාගෙන කැප වී ක්‍රියා කරන ආචාර්ය මණ්ඩලයකින් සන්නද්ධ ව පැවැත්වෙන වත්මන් සිරි වජිරාරාම දහම් පාසල දවසින් දවස දහම් කෙත අස්වද්දමින් ඉදිරියට යන්නේ සැබැවින් ම එහි සියවසක පුරාණයට නව ජීවනයක් ලබා දෙමිනි.

මෙම සියවස් සමරු ජයන්තියේ තේමා පාඨය වී ඇත්තේ "සදහම සවිමත් පරම්පරාවක් - මිනිසි දහම් සරු ශ්‍රී ලංකාවක්" යන්න යි. ඒ තේමා වදන සැබෑ අරුතක් ලෙසින් මල් පල ගන්වන්නට ද, සියවස් ජයන්තිය සාර්ථක ව උත්කර්ෂණයට පත් කරන්නට ද ශාසනාලයයෙන් එක් වන ලෙස දහම් පාසලේ සියලු ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවනට ද සියලු මවුපියවරුනට ද දහම් පාසලේ දියුණුව පතන සියලු භවතුනට ද ළමා - වැඩිහිටි හැම දෙනාට ද අපි ඉත සිතින් ශාසන දයාවෙන් ආරාධනය කරමු.

මීට,

දහම් පාසලේ දියුණුව පතන<br>
**තිරිකුණාමලේ ආනන්ද මහා නායක ස්ථවිර**<br>
අනුශාසක<br>
සිරි වජිරාරාම දහම් පාසල<br>
සිරි වජිරාරාමය, බම්බලපිටිය.<br>
2017-10-01දින දී ය.



## සියවස් සමරු වැඩපිළිවෙළ

### 01 උත්සව සහ පින්කම්

**1.1 සමරු වැඩසටහන ප්‍රකාශයට පත් කිරීම.**

සියවස් සමරු වැඩසටහන ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රථම අදියර ලෙස සිරි වජිරාරාම දහම් පාසල සියවසකට පා තබන 2017. 08. 18 දින තුණුරුවන් මුල්කොට ගෙන බෝධි පූජාවක් සහ අටවිසි බුද්ධ වන්දනාවක් සිදු කොට සියවස් සමරු වැඩසටහන පිළිබඳ යෝජනාවලිය සිරි වජිරාරාමයේ බෝධිරාජයාණන් වහන්සේ අභියස පූජා කොට අනතුරුව මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට පූජා කරනු ලැබේ. මෙදිනට දහම් පාසල් සියවස් සමරු තේමාව ද ඇතුළත් වන ප්‍රදර්ශනාත්මක පුවරුව නිරාවරණය කෙරේ.

මෙම වැඩසටහන ප්‍රකාශයට පත් කිරීමේ දෙවන අදියර ලෙස 2017.10.01 ඉරු දින දහම් පාසලට හා විහාරස්ථානයට සම්බන්ධ සියලු සංවිධාන හා කාර්යාංශත්, සිසු දරු දැරියන් හා දෙමාපියනුත් ආදි සිසු සිසුවියනුත් මාධ්‍යවේදීනුත් රැස් කොට මෙම වැඩසටහන් පෙළ පිළිබඳ මූලික හැඳින්වීම සිදු කරනු ලැබේ. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල වැයක් දැරීමට සිදු වන බැවින් අවශ්‍ය මූල්‍යමය දායකත්වයන් ලබා ගැනීම මානව සම්පත් ආදිය පිළිබඳ එදිනට ම සාකච්ඡා කරනු ඇත.

**1.2 ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් බෝධි පූජා සහ ධර්ම දේශනා පින්කම් පැවැත්වීම.**

සිරි වජිරාරාමවාසී ව වැඩ වුසූ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘන් වහන්සේලා සහ පරලෝ සැපත් ආදි දහම් ගුරු මෑණිවරු පියවරු සිහි කොට ඒ ඒ කාල පරාසයන්හි අධ්‍යාපනය ලද ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් දිවයින පුරා මෙන් ම ලෝකය පුරා විහාරස්ථානවල ධර්ම දේශනා හා බෝධි පූජා පින්කම් පැවැත්වීම. ඒ සඳහා අවශ්‍ය උපදෙස් පත්‍රිකාවක් සකස් කොට නිකුත් කරනු ලැබේ. අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහනා සමිඳු ආරම්භ කළ චාරිකා ධර්ම දේශනා මාලාව සවිමත් කිරීම මෙහි තවත් අරමුණකි.

**1.3 සියවස් සමරු ප්‍රදර්ශනයක් පැවැත්වීම.**

සිරි වජිරාරාමයේ වැඩ වුසූ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘන් වහන්සේලා ගේ ජීවන තොරතුරු අලළා, උන් වහන්සේලා ගේ ලිපි ලේඛන, පතපොත, පාවිච්චි කළ භාණ්ඩ, ඡායාරූප ආදියෙන් සමන්විත ප්‍රදර්ශනයක් 2018. 08. 18 දිනට සමගාමී ව පැවැත්වීමට අපේක්ෂා කෙරේ. මෙහි දී ලක්දිව දහම් පාසල් අධ්‍යාපනයේ ඉතිහාසය මෙන් ම සිරි වජිරාරාම දහම් පාසලේ ඉතිහාසය ද වැඩි දුරටත් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වේ.

**1.4 සියවස් සමරු උළෙල පැවැත්වීම.**

2018. 08. 18 දිනට සමගාමී ව මහා සංඝරත්නය, රාජ්‍ය නායකයින්, කීර්තිමත් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආදි ගුරුභවතුන්,



විද්වතුන් සහභාගී කරවාගෙන වෙසෙසි සමරු උලෙළක් පැවැත්වීමට අපේක්ෂා කරන අතර එහි දී විශේෂ සමරු දේශනයක් සිදු කිරීමට ද අපේක්ෂා කෙරේ.

**1.5 සමරු මුද්දරයක් නිකුත් කිරීම.**

සියවස් සමරු උලෙළට සමගාමී ව විශේෂ සමරු මුද්දරයක් ද නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

**1.6 සියවස් සමරු රුක් රෝපණයක් සිදු කිරීම**

දහම් පාසලේ සියවස් සමරුව සිහි ගන්වමින් වටිනා රුක් රෝපණයක් සිරි වජිරාරාම භූමියේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

## 02 ප්‍රකාශන හා සන්නිවේදන

**2.1 සිරි වජිරාරාමවාසී ස්වාමීන්වහන්සේලා ගේ පැරණි ග්‍රන්ථ හා ලිපි ලේඛන සංරක්ෂණය කිරීම හා පුනර් මුද්‍රණය කිරීම.**

අතීතයේ පාසල් විෂය නිර්දේශයන්ට පවා නියමිත ව තිබූ පැරණි වජිරාරාමවාසී ස්වාමීන්වහන්සේලා ගේ බොහෝ ග්‍රන්ථ හා ලේඛන අද වන විට සොයා ගැනීම පහසු නොවන බැවින් සිරි වජිරාරාමයේ පුස්තකාලය සමඟ එක්ව එම ග්‍රන්ථ සංරක්ෂණයටත් නැවත මුද්‍රණය කිරීමටත් අපේක්ෂා කෙරේ. සංරක්ෂණය කරන ග්‍රන්ථ පුස්තකාලයේ විශේෂ ස්ථානයක තැන්පත් කෙරේ.

### 2.2 බෞද්ධ නිවසක භාවිතයට අත් පොත් සම්පාදනය කිරීම.

අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්වහන්සේ විසින් රචිත "බෞද්ධ ගෙදර" ග්‍රන්ථය පුනර් මුද්‍රණය කොට දහම් පාසලේ සෑම දරුවකු ගේ ම නිවසට ලබා දීම හා ඊට සමගාමී ව බෞද්ධ නිවසක දරුවන් ගේ පිළිවෙත් සපිරීමට අත් පොත ලෙස "බෞද්ධ ළමයා ගේ අත් පොත" නමින් අභිනව කෘතියක් අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහානායක ස්වාමීන් වහන්සේ මඟින් සම්පාදනය කරවා ගෙන එය දරුවන් අතර බෙදා දීම. ඒ අනුව සිය දිවිය මෙහෙයවා ගැනීමට උත්සාහවත් කරවීම.

### 2.3 සියවස් සමරු ග්‍රන්ථයක් සම්පාදනය කිරීම.

සිරි වජිරාරාමයේ හා සිරි වජිරාරාම දහම් පාසලේ ඉතිහාසය ද, පැරණි ඡායා රූපා දී තොරතුරු ද විවිධ විද්වතුන් විසින් සම්පාදිත ශාස්ත්‍රීය ලේඛන ද ඇතුළත් කොට සාරපූර්ණ සමරු ග්‍රන්ථයක් සියවස් සමරුව වෙනුවෙන් එළි දැක්වීමට අපේක්ෂා කෙරේ. මෙය සියවස් සමරු වෙසෙසි උලෙළෙහි දී එළි දැක්වීම ඉලක්ක කොට ගෙන සම්පාදනය කරනු ලැබේ.

### 2.4 "විදුරු පහන" විශේෂ සමරු කලාපයක් පළ කිරීම.

සිරි වජිරාරාම දහම් පාසල මඟින් සම්පාදනය කරනු ලබන විදුරු පහන පුවත් සඟරාවෙහි විශේෂ කලාපයක් දහම් පාසලේ සියවස් සමරුව වෙනුවෙන් පළ කිරීමට අපේක්ෂා කෙරේ.



### 2.5 දහම් පාසලේ වෙබ් අඩවිය ප්‍රවර්ධනය කිරීම.

සිරි වජිරාරාම විහාරස්ථානයේ නිල වෙබ් අඩවියේ දහම් පාසලට සම්බන්ධ තොරතුරු සංවර්ධනය කිරීමත් යාවත්කාලීන කිරීමත් සිදු කොට පසුව වෙන ම වෙබ් අඩවියක් දහම් පාසල නමින් පිහිටුවීමටත් අපේක්ෂා කෙරේ. එමඟින් e - දහම් පාසල් ක්‍රමය හඳුන්වාදීම සහ පළ කරනු ලබන ප්‍රකාශන e-book ලෙස වෙබ් අඩවියට ඇතුළත් කිරීම. තව ද ලොව පුරා සිටින ආදී ශිෂ්‍යයින් මේ සඳහා සම්බන්ධ කර ගැනීමට ද හැකිවනු ඇත.

## 03 යටිතල පහසුකම්

### 3.1. දහම් පාසල් කාර්යාල පරිශ්‍රය සකස් කිරීම.

දිගු කලක් තිස්සේ නිසි පිළිසකර කිරීමක් නො කරන ලද දහම් පාසල් කාර්යාල පරිශ්‍රය ගුරු භවතුන්ට හා දෙමාපියන්ට සිය කටයුතු පහසුවෙන් සිදු කර ගැනීමට හැකි පරිදි සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය ව පවතී. ඒ සඳහා කටයුතු සංවිධානය කිරීමට බලාපොරොත්තු වේ. කාර්යාල පරිශ්‍රයේ රැස්වීම් කාමර, ප්‍රධානාචාර්ය, නි. ප්‍රධානාචාර්ය කාමර, පරිගණක පහසුකම් ආදිය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. කාර්යාලීය කටයුතු ද S -5 ක්‍රමය යටතේ ප්‍රතිසංවිධානය කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.2. ප්‍රාථමික අංශය සකස් කිරීම.

ප්‍රාථමික අංශයේ 1 - 2 ශ්‍රේණිවල දූ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට ප්‍රියජනක ලෙස උඩු මහලේ ශාලාව වාතාශ්‍රය ලැබෙන පරිදි සකස් කිරීමත්, බිත්තිවල චිත්‍ර වර්ණවත් ව සකස් කිරීමත්, බුදු පිළිම වහන්සේ වැඩ සිටින ආසනය ශ්‍රද්ධාව දියුණු වන ආකාරයට සකස් කිරීමටත් අපේක්ෂා කෙරේ. බුදු පිළිම වහන්සේ ගේ පිළිසකර කටයුතු දැනටමත් අරඹා ඇති අතර ඉතිරි කටයුතු සියවස් සමරු වැඩ පිළිවෙලට සමගාමී ව සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.3. ශ්‍රවණාගාරයක් සකස් කිරීම.

විහාරස්ථානයේ සහ දහම් පාසලේ විවිධ රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම සඳහා පහසුකම් සහිත ශ්‍රවණාගාරයක් සකස් කිරීමට ද එහි ම සති පාසල වැඩ සටහන අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා භාවනා ශාලාවක් ඉදි කිරීමට ද අපේක්ෂා කෙරේ.

### 3.4. පිවිසුම් වාහල්කඩ ඉදිකිරීම

විහාරස්ථානයට ප්‍රවේශ වන ස්ථානයේ පිවිසුම් වාහල්කඩක් ඉදි කිරීමට අපේක්ෂිත ව ඇති අතර පරලෝ සැපත් දහම් පාසලේ සම්මානිත ප්‍රධානාචාර්යානී සිරිමා හැගොඩ මහත්මිය ඒ සඳහා මූලික ධන පරිත්‍යාගයක් ද සිදුකොට ඇත.



## 04 ආධ්‍යාත්මික ආකල්ප හා අධ්‍යාපන සංවර්ධන

### 4.1 සති දහම් පාසල පිහිටුවීම.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි කම්මට්ඨානාචරිය අතිපූජ්‍ය උඩුර්රියගම ධම්මජීව ස්වාමීන් වහන්සේ ගේ අනුශාසනා පරිදි දිවයින පුරා පාසල් වල ක්‍රියාත්මක කෙරෙන "සති පාසල" සිහිය පුහුණු කිරීමේ භාවනා වැඩ පිළිවෙල "සති දහම් පාසල" නමින් සිරි වජිරාරාම දහම් පාසල තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙය සියවස් සමරුවට සමගාමී ව ආරම්භ කොට අඛණ්ඩ ව භාවනා පුහුණුව ලබා දීමේ අපේක්ෂාවෙන් සිදු කරනු ලැබේ.

### 4.2 **S**- 5 සංකල්පය

ක්‍රමානුකූලභාවය හා කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ලොව පුරා ප්‍රකට සංකල්පයක් වන **S**- 5 සංකල්පයේ මූලික අදහස්වලට අනුව බෞද්ධ සංකල්ප ගලපා ගනිමින් දහම් පාසලේ සියලු කටයුතු බෞද්ධ සංකල්ප මත පදනම් ව වඩාත් ක්‍රමානුකූලභාවයට පමුණුවා ගැනීමට අපේක්ෂා කෙරේ.

### 4.3 ගුරු ආකල්ප ප්‍රවර්ධනය

දහම් පාසලේ නිස්සරණාධ්‍යාශයෙන් සේවය කරනු ලබන ගුරු භවතුන් ගේ පුණ්‍ය පාරමිතාව වඩා අර්ථ සම්පන්න කරනු සඳහා ඒ ඒ වයස් කාණ්ඩවල දරුවන් ගේ මානසික අවශ්‍යතා හඳුනාගෙන ඒවාට සංවේදී වෙමින් වඩාත් සාර්ථක ඉගැන්වීමේ ක්‍රියාවලියකට අවශ්‍ය ගුරු පුහුණුව ලබාදීම මෙයින් අපේක්ෂා කෙරේ.

**4.4 උපදේශන ඒකකයක් ආරම්භ කිරීම.**

දහම් පාසල් සිසු දරු දැරියන් ගේ යම් යම් ගැටලු, ළමා මනස හඳුනාගෙන විසඳීමට සමත් උපදේශකවරුන් ගේ සේවය ලබා ගනිමින් සාර්ථක ළමා උපදේශන ඒකකයක් පිහිටුවීමට මෙයින් අපේක්ෂා කෙරේ.

### 4.5 ඉංග්‍රීසි ධර්ම පන්ති ආරම්භ කිරීම

ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන ජාත්‍යන්තර පාසල් වල දරුවන් ගේ පහසුව සඳහා සිරි වජිරාරාම දහම් පාසලට අනුබද්ධව ඉංග්‍රීසි ධර්ම පන්ති කීපයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ධර්ම අධ්‍යපනය ලබා දෙන ''ඉංග්‍රීසි මාධ්‍ය දහම් පාසලක්'' යන සංකල්පයට වඩා ආධ්‍යාත්මික සංවර්ධනයට මුල් තැන දෙමින් පිළිවෙත් පුහුණුව සිදු කිරීම එහි අපේක්ෂාව යි.

## 05 සමාජ සත්කාරක

**5.1. දුෂ්කර දිස්ත්‍රික්කයන්හි පවත්වාගෙන යනු ලබන දහම් පාසල් හා විහාරස්ථාන සංවර්ධනය කිරීම.**

දුෂ්කර දිස්ත්‍රික්කයන්හි පවතින දහම් පාසල් හා විහාරස්ථාන තෝරා ගෙන එම දහම් පාසලට හා විහාරස්ථානයට අවශ්‍ය ආධාර ලබා දෙමින් ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. සියවස් සමරු වර්ෂයේ සිට ආරම්භ කොට වර්ෂයකට එක් දහම් පාසලක් බැගින් වන සේ මෙම වැඩ පිළිවෙල පවත්වාගෙන යාමට අපේක්ෂා කරනු ලබ යි.



සිරි වජිරාරාම දහම් පාසලේ ගෞරවාර්හ අනුශාසක අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් පත් කරන ලද සියවස් සමරු අනුකමිටුව මඟින් යෝජනා කරන ලදුව සිරි වජිරාරාම දහම් පාසල් උපදේශක කමිටුව මඟින් සම්මත කරන ලද බම්බලපිටිය සිරි වජිරාරාම දහම් පාසලේ සියවස් සමරු වැඩපිළිවෙළ යි.

මෙම සියවස් සමරු වැඩසටහන් පෙළ සාර්ථක කර ගැනීම සඳහා සියලු මවුපියවරුන්ගේ ද, ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ද, දහම් පාසලෙහි දියුණුව පතන භවතුන්ගේ ද සහයෝගය අපේක්ෂා කරන බැවින් පසු පිටෙහි ඇති තොරතුරු පත්‍රිකාව පූර්ණය කොට අප වෙත ලබා දෙන්නේ නම් අතිශය කෘතඥවෙමු.

තෙරුවන් සරණයි !

**කළමනාකරණ මණ්ඩලය**
**සිරි වජිරාරාම දහම් පාසල**

- නම :-

- ලිපිනය :-

- වෘත්තීය ස්වභාවය :-

- දුරකථන අංක : නිවස :- ජංගම :-
- විද්‍යුත් ලිපිනය :-
- මුහුණු පොත :-

- ඔබ සියවස් සමරුවට සම්බන්ධ වනුයේ

  ආදි ශිෂ්‍ය - ශිෂ්‍යාවක ☐ / මවු පියෙකු ☐ /

  දියුණුව පතන භවතෙකු ☐ වශයෙන් යන වග

- ඔබගේ දායකත්වය ලබා දිය හැකි ස්වභාවය

  මූල්‍යමය ☐ / සම්පත් ☐ / ශ්‍රම ☐

- ඔබගේ දායකත්වය ලබා දිය හැකි ව්‍යාපෘතියේ හෝ ව්‍යාපෘති වල අනු අංකය . උදා :- සියවස් සමරු ග්‍රන්ථය සකස් කිරීම

  අනු අංක 2.3 වශයෙනි.